## 3.17 ආනතිමානයක් නිමවුම හා භාවිතය


(අ) පෙර දැනුම

i සිරස, තිරස හඳුනා ගැනීම

ii පෘථිවිය මත තිරස හඳුනා ගැනීම

iii සිරස් තලයේ ඇති සෘජු රේඛා හඳුනා ගැනීම

(ආ) උපකරණය සහ එහි උපාංග




(ඇ) උපකරණ නිමවුමට කාර්යය පත්‍රිකාව

i. විනිවිද නොපෙනෙන සිහින් දිග බට කැබැල්ලක් ("ආ" හි විෂ්කම්භයට මදක් දිගින් වැඩි) ගන්න.

ii.

a. අර්ධ වෘත්ත කිහිපයක් ද ඝන කාඩ්බෝඩ්වලින් කපා එක මත අලවා ගෙන ඝනකම් අර්ධ වෘත්තආස්තරයක් ලබා ගන්න.

b. එහි (ආ) කොටසේ පරිදි පරිමාණය ගෙන අර්ධ වාත්ත ආස්තරයේ ලකුණු කරන්න.

c. එම අර්ධ වෘත්ත ආස්තරයේ විෂ්කම්භය දිගේ සිහින් බටය අලවා ගන්න. එහිම ලක්ෂ්‍යයක් (කේන්ද්‍රය) හරහා සිදුරක් විද ගන්න.

d. තුනී විනිවිද පෙනෙන ශක්තිමත් තහඩුවකින් "ආ" අර්ධ වෘත්තයට මදක් විශාල අර්ධ වෘත්තයක් කපා ගෙන එහි L හි කුඩා කවුළුවක් සකසා K හි සිදුරක් විද ගන්න.

e. ආධාරක ලෑල්ලක සකසා ගත් ලී කණුවක් ලම්බව සවිකර ආධාරකය සකසා ගෙන එහි තිරස් පටියේ සිහින් ඇණයක් එල්ලා, ආධාරක ලෑල්ල මත ඇණ තුඩු ස්පර්ශවන සේ වෙනත් ඇණයක් සවි කරන්න.

iii. උපකරණයේ දැක්වෙන පරිදි ඉහත සියළු කොටස් ගොනු කරමින් ආනතිමානය නිමවන්න.

(ඈ) උපකරණ භාවිතයට කාර්යය පත්‍රිකාව

i. කුඩා දම්වැලි කැබැල්ල නිරීක්ෂණය කරමින් AB දණ්ඩ සිරස්ව පවතින සේ උපකරණය ස්ථානගත කර ගන්න.

ii. සිහින් බටය තුළින් අවශ්‍ය පිහිටීම නිරීක්ෂණය වන සේ බටය සහිත කෝණමානය වස්තුව දෙසට භ්‍රමණය කර ගන්න.

iii. උපකරණයෙහි කුඩා කවුළුව තුළින් බලා අවශ්‍ය පිහිටුමේ ආනතිය (ධන අග්‍රයෙන් ආරෝහණ කෝණය ද සෘණ අග්‍රයෙන් අවරෝහණ කෝණය ද ලෙස) ලබා ගන්න.

iv. මෙලෙස විවිධ පිහිටුම් වල ආනතිය මැන ගැනීමට මෙන්ම නියමිත ආනතියකින් යුතු විවිධ පිහිටුම් පිළිබඳ විමසුමට උපකරණය භාවිතයට හුරු වෙන්න.